# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2026 අංක 23 දරන
## අධිකරණ සංවිධාන (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2026 සැප්තැම්බර් මස 25 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2026 සැප්තැම්බර් මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 20.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2026 අංක 23 දරන**
**අධිකරණ සංවිධාන (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2026 සැප්තැම්බර් මස 25 වන දින]

එල්. ඩී. -ඕ. 25/2026

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2026 අංක 23 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 4 වන වගන්තියේ (අ) ඡේදයේ "එකසිය දහයකට වැඩි නොවන්නා වූ ද, විනිශ්චයකාරවරයන්ගෙන්;" යන වචන වෙනුවට "එකසිය විසිදෙනකුට වැඩි නොවන්නා වූ ද, විනිශ්චයකාරවරයන්ගෙන්;" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1978 අංක 2 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (3) වන උපවගන්තියේ, "අවුරුදු හැට එක" යන වචන වෙනුවට "අවුරුදු හැට තුන" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (4) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(4) (355 වන අධිකාරය වූ) රජයේ හා අධිකරණ නිලධරයන් (විශ්‍රාම ගැන්වීමේ) ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, වෙනත් සියලුම

විනිශ්චයකාරවරයන් සහ මහෙස්ත්‍රාත්වරයන් විශ්‍රාම ගත යුතු වයස අවුරුදු හැට දෙක විය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**4**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.